## පැල මැක්කන්, කුඩිත්තන් සහ සුදුමැස්සන් සඳහා

- ඉමිඩක්ලොප්‍රිඩ් 20එස්.එල්. 500-750 මිලි/හෙක්
- ෆිප්රොනිල් 5එස්.සී. 500 මිලි/හෙක්
- කාබොසල්ෆාන් 20ඊ.සී 1400 මිලි/හෙක්
- ෆොසලොන් 35ඊ.සී 1200-1800 මිලි/හෙක්
- ඇබමෙක්ටින් 1.8ඊ.සී. 300 මිලි/හෙක්
- තයමෙතොක්සාම් 25ඩබ්.ජී 10 ග්‍රෑම්/16ලීටර්

මයිටාවන් සඳහා

සල්ෆර් 80% කුඩු 2.8-3.6 කි.ග්‍රෑම්/හෙක්

ඇබමෙක්ටින් 1.8ඊ.සී. 300 මිලි/හෙක්

## කරල් විදින දළඹුවන්

මිරිස් වගාවට *Spodoptera litura* හා *Helicoverpa armigera* යන විශේෂ දෙකම හානිකරයි

*Spodoptera litura*

- සුහුඹුලා මධ්‍යම ප්‍රමාණයේ සලබයෙකි
- පූර්ව පියාපත් වල දුඹුරු ලප සහිත වන අතර අපර පියාපත් සුදු පාටය
- වැඩුණු කීටයන් ලා අළු පාට හෝ කළු පැහැයට හුරු කොල පාට වන අතර ශරීරයේ ඉදිරිපස කළු පටියක් ඇත. මි.මී. 40-50 පමණ දිගය.





*Helicoverpa armigera*

- සුහුඹුලා දුඹුරු පැහැති සලබයෙකි
- කීටයා විසින් බෝගයට හානි කරනු ලබන අතර මි.මී. 40-50ක් පමණ දිගැතිය. පාර්ශ්විකව ලා සහ තද පැහැති ඉරි වලින් සමන්විතය.





හානිය

- දළඹුවන් පත්‍ර, අංකුර, මල් හා කරල් ආහාරයට ගනී.
- හානි වූ කරල් වල රවුම් සිදුරු දක්නට ලැබේ



හානිය පාලනය

- ක්ලෝෆ්ලුඑසියුරෝන් 5ඊ.සී 750 මිලි/හෙක්
- තයෝඩිකාබ් 375එස්.සී 750-1250 මිලි/හෙක්
- තයෝඩිකාබ් 75% කුඩු 1 කි.ග්‍රෑම්/හෙක්

විමසීම් : අධ්‍යක්ෂ,
සෙත්‍ර භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය මහඉලුප්පල්ම.

Designed & Printed by : AUDIO VISUAL CENTRE, Department of Agriculture

අපි වවමු - රට නඟමු

දේශීය ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුම 2007-2010

# මිරිස් වගාවේ පලිබෝධ



කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.

# මිරිස් වගාවේ පලිබෝධ

## මිරිස් කොළ කොඩවීම

තවාන් අවධියේ සිට වගාවේ ඕනෑම අවස්ථාවක ඇතිවිය හැක.

## කොළ කොඩවීම ඇතිවිය හැකි ආකාර

- පැල මැක්කා කුඩිත්තා හා මයිටාවා යන සතුන් ලපටි පත්‍ර වලින් යුෂ උරාබීමෙන්
- සුදු මැස්සා මඟින් ව්‍යාප්ත වන වයිරසයක් නිසා

## පැල මැක්කා (*Scirtothrips dorsalis*)

මි.මී. 1ක් පමණ දිග ලා දුඹුරු පැහැති සිහින් කෘමියෙකි.




හානිය

- වැඩුණු සතුන් හා ශිශුවන් මිරිස් පත්‍ර වල උඩු පැත්තේ සිට යුෂ උරා බීම නිසා පත්‍ර දාර දිගේ උඩ අතට රෝල් වේ.
- හානියට ලක්වූ පත්‍ර පළමුව දිළිසෙන සුළු රිදී පැහැයක් ගෙන පසුව දුඹුරු පැහැවේ.
- හානියට ලක්වූ මිරිස් කරල් වල දුඹුරු පැහැති සළකුණු දැකිය හැකි අතර කරල් කෙටිවී ඝනවී දුර්වර්ණවී යයි.

වියළි කලාපය තුල මිරිස් කොළ කොඩවීම යල කන්නයේ ජූලි-අගොස්තු මාස වලදී බහුල ලෙස දැකිය හැකි අතර එම මාස වල පවතින අධික උෂ්ණත්වය හා තද සුළං මෙයට හේතු කාරක වේ.

## මයිටාවන් (*Hemitarsonemus latus*)

පියවී ඇසින් පැහැදිලිව දැක ගැනීමට අපහසු ඕවලාකාර,ලා දුඹුරු පැහැති සතෙකි.




හානිය

- මිරිස් පත්‍රයේ යටිපැත්තේ සිට යුෂ උරා බොන අතර ඒ හේතුවෙන් පත්‍ර දාර දිගේ යටි අතට රෝල්වේ
- පත්‍ර වල යටි පෘෂ්ඨය ක්‍රමයෙන් දුඹුරු පාටවේ
- හානිය අධික වූ විට පත්‍ර ඝනකමින් වැඩි වී ඉක්මනින් කැඩෙන සුළු තත්වයට පත් වේ
- හානියට ලක් වූ කරල් විකෘති වී මළකඩ පැහැයක් ගනී

## කුඩිත්තන්

මි.මී. 1-2ක් පමණ විශාල, කළු පැහැති (*Aphis gossypii*) හා මි.මී. 1.25-2.5ක් පමණ විශාල කහමය කොළ පැහැති (*Myzus persicae*) විශේෂ දෙක මිරිස් වගාවට හානි කරයි.




හානිය

- මෙම සතුන් සමූහ වශයෙන් පත්‍ර වලින් හා කඳෙන් යුෂ උරා බීම නිසා පත්‍ර කෝප්පාකාර හැඩයට හැරී කහ පැහැ වේ.
- පැළ වල වර්ධනය අඩු වන අතර සිහින් කරල් හට ගනී.

## සුදුමැස්සා (*Bemisia tabaci*)

මි.මී. 1ක් පමණ දිග සුදුමැස්සා මිරිස් කොළ කොඩවීමේ වෛරස් රෝගය පතුරුවා හරින වාහකයා වේ.




හානිය

- හානියට ලක් වූ මිරිස් පැළ වල පත්‍ර කහ පැහැ වේ. බෝට්ටුවක ආකාර ගනී.
- නාරටි පැහැදිලි වේ.
- පර්ව අතර පරතරය අඩුවේ.
- ශාක කුරු වී පඳුරු ආකාරයට වර්ධනයවේ.

## මිරිස් කොළ කොඩවීම පාලනය

- හොඳ ගුණාත්මයෙන් යුත් බීජ තෝරා ගැනීම
- තවාන් පාලනය ක්‍රමවත්ව සිදුකිරීම මඟින් දිරිමත් පැළ ලබා ගැනීම
- වගාව නියමිත කාලයට සංස්ථාපනය කිරීම

  යල කන්නය මාර්තු මස මුල වන විට තවාන් ආරම්භ කර අප්‍රේල් මසදී භෝගය ක්ෂේත්‍රයේ පිහිටුවීම කළ යුතුය.
- සුළං බාධක භෝග ලෙස බඩඉරිඟු, කුරක්කන් වැනි භෝගයක් ක්ෂේත්‍රයට වටා සිටුවීම
- යූරියා පොහොර විශාල වශයෙන් වගාවට නොයොදා නිර්දේශිත පොහොර භාවිතා කිරීම
- වසුන් යෙදීම
- ජලය ඉසීම
- ඇලෙනසුළු උගුල් භාවිතය
- නිර්දේශිත කෘමිනාශක භාවිතය